මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 - 01 - 09

පැමිණිලි පාර්ශවය : එස්.එම්.හීන්මැණිකා මිය.
අංක 5/සී, කෙහෙල්උල්ල,
පදියතලාව.

වගඋත්තර පාර්ශවය : 01. නේවාසික ව්‍යාපාර කළමණාකරු,
නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය,
රඹකැන්ඔය කලාපය,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
මහඔය.

02. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාය,
පදියතලාව.

<u>පැමිණිලි අංකය : HRC/AM/68/14</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම**

උක්ත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාට ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අම්/පදි/140/128/(1995) රුඩි 02කට අයත් බලපත්‍ර ඉඩමේ තමන් පදිංචිය දරන බවත් උක්ත බලපත්‍ර ඉඩමේ හතර මායිම උතුරට ඩී.එල්.ඩබ්.චාර්තිස් සිල්වාගේ ඉඩම, නැගෙනහිරට අඩි පාර, දකුණට ඊ.එච්.එම්.සුදුකුමාගේ ඉඩම, බටහිර බදුල්ල මඩකලපුව මාර්ගය ලෙස සඳහන් බවයි. එයින් බටහිර මායිම් වන බදුල්ල මඩකලපුව මාර්ගයට අයත් කොටසේ අවමංගල්‍යාධාර සමිතිය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට තමා කැමැත්තෙන් පර්චස් 3.31 ක ඉඩම් ප්‍රමාණයක් ලබාදුන් බවත් එහි සමිති ගොඩනැගිල්ලක් තනා ඇති බවත් සඳහන් කර ඇත. එසේ තිබියදී අදාළ සමිතියේ නිලධාරින් ප්‍රාදේශීය ලේකම් හා එක්ව තම ඉඩමෙන් බදුල්ල මඩකලපුව මාර්ගයට අයත් මායිමෙන් පර්චස් 15ක පමණ බිම් කොටසක් සමිතිය නමින්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වෙන් කිරීම සිදු කිරීම නිසා තමාට අදාල ඉඩමෙන් ප්‍රවේශ මාර්ගය පමණක් ඉතිරිව ඇති බවත් නීත්‍යානුකූල නොවන ලෙස තම බලපත්‍රය වලංගුව පවතිද්දි තමාට තම බලපත්‍රයට අයත් (ව්‍යාපාරික වටිනාකමක් සහිත) බිම් කොටස අහිමි කර ඇති බවත් එබැවින මේ පිළිබඳව සොයා බලා සහනයක් ලබා දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම =:**

පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත 03/03/54 හා 2015.02.27 දිනැති වාර්තා ඉදිරිපත් කරමින් වගඋත්තරකාර ප්‍රාදේශීය ලේකම් පදියතලාව විසින් දන්වා ඇත්තේ, තමාගේ ක්ෂේත්‍ර නිලධාරින් මගින් සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂණයේදී ඩබ්.එම්.හීන්මැණිකා මහත්මිය තමාට අයත් බලපත්‍රයේ සඳහන් රූඩ් 02ක ප්‍රමාණයට වඩා වැඩි බිම් කොටසක් භුක්ති විදින බව අනාවරණය වූ බවයි.

එසේම 2020.01.02 වන දින නිකුත් කර ඇති අම්/පදි/140/120 (1995) අංක දරණ බලපත්‍රයේ සතර මායිම් ලෙස බටහිර දිසාවට බදුල්ල මඩකලපුව මාර්ගය සඳහන් වුවත් එය බටහිරට සමගි අවමංග්‍යාධාර සමිති ගොඩනැගිල්ල ලෙස සංශෝධනය විය යතු වන අතර ඇයගේ රූඩ් 02 ක බිම් ප්‍රමාණය මැන වෙන් කළ පසු අවමංගල්‍යාධාර සමිති ගොඩනැගිල්ල පිහිටි ඉඩම මහවැලි අධිකාරිය වෙතින් නිත්‍යානුකූලව වෙන් කර ගතයුතු බව දන්වා ඇත.

එසේම සියලුම පාර්ශව කැඳවා ඩබ්.එම්.එම්.හීන්මැණිකා මහත්මියගේ ඉඩමේ ඇති රූඩ් 02 බිම් ප්‍රමාණය මැන ඉවත් කර දීමට 2015.02.26 වන දින යොදා ගෙන තිබුනද පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාව මගින් තමාට විසඳුමක් ලබා දෙන තෙක් කිසිදු පරීක්ෂණයකට තමාට සහභාගි නොවන ලෙස දන්වා ඇති බැවින් ඒ සඳහා ඉඩදිය නොහැකි බව ප්‍රකාශ කළ බැවින් ආරවුල නිරවුල් කළ නොහැකි වූ බවත් කොමිෂන් සභාව ඇය වෙත දැනුම දුන් පසු ආරවුල නිරවුල් කිරීමේ හැකියාව පවතින බවත් දන්වා ඇත.

2015.04.09 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී පැමිණිල්ලට අගතියක් නොවන පරිදි බදුල්ල මඩකලපුව මාර්ගය මායිමෙන් සමිති ශාලාවට උතුරු මායිමෙන් ප්‍රමාණවත් ඉඩම් කොටසක් හසුවන ලෙස මැනුම් කර දී පැමිණිල්ල සමථයකට පත් කිරීමට වගඋත්තර පාර්ශවය එකගතාව පළ කර ඇත.

2016.10.25 දින පැවති පරීක්ෂණයේදී ද ගැටලුව කඩිනමින් පැමිණිල්ලට අගතියක් නොවන ලෙස මැනුම් කර විසඳුම් ලබාදීමට වගඋත්තර පාර්ශවයට එකගතාවය එලකර ඇත.

2019.11.05 දින පැවති පරීක්ෂණයේදී පැමිණිල්ල තම ඉඩමට අදාලව අම්පාර දිසා අධිකරණයේ නඩු අංක 644 අනුව උසාවි නියෝගයක් මත මැනුම් කරන ලද සටහනේ 1 කොටස ඇතුලත්ව HE සඳහන් සමිති ශාලාවට දකුණු පැත්තට වත්තට පර්චස් 07ක් සමිතිය සඳහා ලබාදීමට පැමිණිල්ල කැමැත්ත දක්වා ඇත. (අදාල නඩුවේ තීන්දුව ලබාදීමට ප්‍රථම පැමිණිල්ල ඉවත් කරගෙන ඇති බවද දන්වා ඇත)

දැනට අදාල ඉඩම්වල භාරකාරත්වය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරා ඇති බැවින් ඉහත ඉල්ලීම් සලකා බලා ඒ අනුව මැනුම් කිරිමට මැනුම් නියෝගයක්ල ලබාදිය හැකි බවට වගඋත්තර පාර්ශවය කැමැත්ත එල කර ඇත.

පලවන වගඋත්තර පාර්ශවය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රඹකැන්ඔය කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර 2020.02.20 වන දින අංක RPM/RO/L/12 වාර්තාව මෙම කොමිෂන් සභාව වෙත යොමු කරමින් පැමිණිල්ලට අදාළ අම්/පදි/140/128 (1996) අංක දරණ බලපත්‍රයේ බටහිර මායිම් 2019.02.20 දින ප්‍රාදේශීය ලේකම් පදියතලාව බදුල්ල මඩකලපුව මාර්ගය හා සමගි අවමංගල්‍යාධාර සමිති ගොඩනැගිල්ල ලෙස සංශෝධනය කර ඇති බවත් දන්වා ඇත.

එසේම අදාල ප්‍රදේශයේ රජයේ ඉඩම් පිළිබඳ රාජකරි කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගැසට් කිරීම නිසා අදාල ඉඩමමේ පැවරුම් කටයුතු නතර වී ඇති බවත් එම කොහෙල්උල්ල සමිති ශාලා ගොඩනැගිල්ල වෙන් කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය ලේකම් පදියතලාව 2019.04.10 දිනැති ලිපියෙන් පදියතලාව කොට්ඨාස කාර්යාලයට යොමු කර ඇත. ඒ අනුව කෙහෙල්උල්ල අවමගල්‍යාධාර සමිතියට පර්චස් 15ක් කොටස පැවරීමට අදාල භූමිය හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මිනින්දෝරු එස්.ටී.ඩී.එන්.තිලකරත්න මහතා අදාල සමිතියේ ලේකම්. පදියතලාව ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරි එස්.එන්.ඩයසුරිය. මහවැලි අධිකාරියේ ඉඩම් නිලධාරි පදියතලාව පොලිස් ස්ථානයේ පො.සැ. 6450 හා මහවැලි අධිකාරියේ කොට්ඨාශ කළමණාකරු ඒකාබද්ධව ස්ථානීය පරීක්ෂණයක් සිදු කර bps/lad/HWNRC/L3/01 දරණ 2019.04.10 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජනපද නිලධාරි හා ග්‍රාම නිලධාරි රජයේ ඉඩමක් ලෙස සමිති ශාලාව පවතින භූමිය හඳුනා ගන්නා ලද බව දන්වා ඇත.

ඒ අනුව අදාල සමිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි සමිතියක් බැවින් එයට අදාල ඉඩම් පවරන ලෙස 2019.08.30 දිනැති ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම අනුව ඉඩම පැවරීමට අදාල ලේඛන හා නිර්දේශ ලබා දෙන ලෙස කෙහෙල්උල්ල වසමේ ඒකක කළමණාකාර BM/PT/L සමාගම් හා 2019.09.15 දිනැති ලිපියෙන් දක්වා ඇත. ඒකක කළමණාකාර විසින් නිර්දේශ සහිතව ලබා දුන් වාර්තාව අනුව සමගි අවමංගල්‍යාධාර සමිතිය පිහිටි ඉඩම් පැවරීමට අදාල

ලේඛන නිර්දේශ සහිතව කොට්ඨාශ කළමණාකාර 2019.10.10 දිනැති ලිපිය මගින් නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලය වෙත යොමු කර ඇති බවත් එම ඉඩම් නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලයත් භෞතික සැලසුම් කමිටුවක් පරික්ෂා කර ලබාදීම සිදුසු බව නිර්දේශ කර දැනට ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (ඉඩම් පරිහරන සැලසුම්) වෙත යොමුකර ඇති බවද දන්වා ඇත.

**පැමිණිල්ලේ විරෝධතා =:**

පැමිණිලිකරු තමාට අයත් බලපත්‍රය තුළ ඇති මෙම කොටස (ව්‍යාපාරක වටිනාකමක් සහිත) තමා අවමංගල්‍යාධාර සමිතියට ලබාදීමෙන් තමා අගතියට පත්ව ඇති බැවින් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු =:**

01. කොහෙල්උල්ල හි පදිංචි පැමිණිලි පාර්ශවය සමරකෝන් මුදියන්සේලාගේ හීන්මැණිකා මහත්මියට 2008.01.02 වන දින රූඩ් 02ක් සඳහා අම්/පදි/140/128(1995) දරණ ඉඩම සංවර්ධන ආඥා පනතේ 10 (2) වන වගන්තිය යටතේ නිකුත් කරන අවසර පත්‍රය ලබාදී ඇති බව අනාවරණය වේ.

02. එහි සතර මායිම ලෙස.

| | | |
|---|---|---|
| උතුරට | :- | ඩී.එල්.ඩබ්. චාර්තිස් සිල්වාගේ ඉඩම |
| නැගෙනහිරට | :- | අඩිපාර |
| දකුණට | :- | ජී.එච්.එම්. සුදුකුමාගේ ඉඩම |
| බටහිර | :- | බදුල්ල මඩකලපුව මාර්ගය |

ලෙස සඳහන් වන බව අනාවරණය වේ.

03. පසුකාලීනව ප්‍රශ්නගත සමිති ශාලාව එහි බටහිර මායිමට වන්නට ඉදිකර ඇති බව අනාවරණය වේ.

04. උක්ත සමිති ශාලාව සමගි අවමංගල්‍යාධාර සමිතිය විසින් ඉදිරිකර ඇති බව අනාවරණය වේ.

05. මේ වනවිට අදාළ සමිති ශාලාව සඳහා පාර්චස් 15ක ඉඩම් කොටසක් හීන් මැණිකා මහත්මියගේ ඉඩමේ බටහිර මායිමෙන් වෙන්කර ඇති බව අනාවරණය වේ.

06. අම්පාර දිසා අධිකරණයේ නඩු අංක 644 ඉඩම අනුව අදාල ඉඩම මැන ඇති අතර. ඒ අනුව එහි A, B, C, D, E, F, G, H, K, L ලෙස කොටස් නම්කර එහි මුළු ඉඩම් ප්‍රමාණය හෙක්. 0.3573 ක් ලෙස සඳහන් කර ඇති බව අනාවරණය වේ. :අදාළ නඩු තීන්දුවට පෙර ඉල්ලා ඇස්කර ගැනීමට පැමිණිල්ල කටයුතු කර ඇති බව දන්වා ඇත)

07. පැමිණිල්ල එම උසාවි නියෝග අනුව කළ මැනුමේ සඳහන් A කොටස හා L කොටස වෙනත් පාර්ශවයක් භුක්ති විඳින බව අනාවරණය කරයි.

08 2019.11.15 දින මෙම කොමිසමේ පරීක්ෂණය සඳහා සහභාගි වූ සමන් කුමාර ජයසූරිය ජනපද නිලධාරි සඳහන් කරන්නේ A – L කොටස් ඉවත් වුවද අදාල ඉඩමේ රූඩ් 02 යි පර්චස් 05ක ප්‍රමාණයක් ඇති බව අනාවරණය කරයි.

09. පැමිණිලි පාර්ශවයේ ඉඩම තුළ මරණාධාර සමිතියට දැනට වෙන්කර ඇති පර්චස් 15 ද සමගම ඇත්තේ රූඩ් දෙකකටත් අඩු ඉඩම් ප්‍රමාණයක් බව අනාවරණය කරයි.

10. පැමිණිලිකරුගේ බලපත්‍ර ඉඩමේ තුළ බටහිර මායිම 2019.02.20 දින පැමිණිලිකරු වෙත දැන්වීමක් හා කැමැත්ත ලබා ගැනීමකින් තොරව ප්‍රාදේශීය ලේකම් පදියතලාව විසින් සංශෝධනය කර ඇති බව අනාවරණය වේ.

11. එසේ බලපත්‍රයේ බටහිර මායිම සංශෝධනයකර සමිති ශාලාව සහිත ඉඩම් කොටස රජයේ ඉඩමක් බවට පත් කරගෙන ඇති බවත් ඒ සඳහා බලපත්‍රලාභියා කැමැත්ත පලකර නොමැති බවත් අනාවරණය වේ.

12. ප්‍රාදේශීය ලේකම් පදියතලාව 2020.02.20 දිනැතිව පැමිණිලිකරුගේ බලපත්‍රයේ සතර මායිම බලපත්‍රකරුගේ කැමැත්තකින් හෝ දැන්වීමකින් තොරව සංශෝධනය කිරීමෙන් රජයේ ඉඩමක් බවට පත් කර සමිති ශාලාව ඉදිකර ඇති භූමිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමිති ශාලාවට සඳහා ලබාදීමට අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු මේ වනවිට සිදු කර ඇති බව අනාවරණය වේ.

**විශ්ලේෂණය -:**

පැමිණිලිකරු වෙත නීත්‍යානුකූල හිමිකම ඇති ඉඩම් කොටස නිරවුල් කර නොදීම තුලින් පැමිණිලි පාර්ශවය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වගන්තිය මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව අනාවරණය වේ.

නිර්දේශය -:

ඒ අනුව, වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින්, පැමිණිලිකරු වෙත නිත්‍යානුකූලව ලබාදී ඇති අම්/පදි/140/128/1995 දරණ බලපත්‍රයට අයත් බිම් කොටසෙන් පැමිණිලිකරු කැමැත්ත පළකර ඇති පරිදි සමගි අවමංගල්‍යාධාර සමිතිය වෙත පර්චස් 07ක ඉඩම් කොටසක් ලබාදී ඉතිරි ඉඩම් කොටස පැමිණිලිකරු වෙත ලබාදීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළයුතුය.

2023. 02 . 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුවඉදිරිපත් කරනු ලබනඉල්ලීම් සම්බන්ධයෙන්ස ලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මහාචාර්ය.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Ka
Commissione
Human Rights Commission

පිටපත : 01. ගරු අමාත්‍යතුමා,
මහවැලි සංවර්ධන අමාත්‍යාංශය,
ටී.බී ජයා මාවත, කොළඹ 01.

02. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

R/-